දුර්ලභ

# මැත-විට්ගන්ස්ටෛනියානු භාෂා දර්ශනය

තුලසේන විදානගමගේ

ප්‍රවේශ අංකය 44

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රීලංකාව,

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය ( දර්ශනය ) සඳහා

ඉදිරිපත් කරන ලද නිබන්ධයයි.

1981

## උ ධෘ ත ය

විසිවන සියවස දර්ශනයේ ස්වභාවය විචාරාත්මක සහ විශ්ලේෂී එකකි. එය භාෂාව ඇසුරෙන්ම ගොඩනැගුනේ වෙයි. භාෂාමය දර්ශනය පිළිබඳව කරන අධ්‍යයනයකදී විට්ගන්ස්ටෛන් අමතක කළ නොහැකි ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙකි. ඔහුගේ චින්තනය පිළිබඳව කෙරෙන මේ අධ්‍යයනයේදී එහිලා පැනෙන විවිධ වට්නාකම් නවතම දෘෂ්ටිකෝණයකින් සළකා බැලේ.

මුලින්ම විට්ගන්ස්ටෛනියානු දර්ශනයේ ඓතිහාසික පසුබිම කෙරෙහි අපගේ අවධානය යොමු කෙරී ඇත. දීර්ඝ කාලීන විපරිනාම -යක මල්ඵල ගැන්වීමක් වූ භාෂාමය දර්ශනයට පිවිසීමේදී එම ඓතිහාසික විකාශනය තුලින් එය වෙන්කොට ගැනීම අපහසු කාර්යයකි. එමනිසා විට්ගන්ස්ටෛනියානු භාෂාමය දර්ශනය ඉදිරිපත් කරන්නට පෙර සාම්ප්‍රදායික අවධීන්තුල විවිධ චින්තකයින් භාෂාව කෙරෙහි දැක්වූ ආකල්පයන් මුල් පරිච්ඡේදය තුළදී විමසුමට භාජනය කෙළෙමු.

දෙවන පරිච්ඡේදයෙන් විට්ගන්ස්ටෛනියානු දර්ශනයට හැඳින්වීමක් සැපයේ. සමකාලීන දාර්ශනික චින්තා අතර විට්ගන්ස්ටෛනියානු දර්ශනයට හිමිවන ස්ථානය පිළිබඳවත් ,භාෂාව මෙන්ම එහි අර්ථය පිළිබඳවත් ,ඔහු ඉදිරිපත් කළ අදහස් ,සෙසු දාර්ශනික ආකල්පයන්ගෙන් වෙන්ව කැපීපෙනුනු අයුරු මෙහිදී සළකා බැලිනි.

තෙවන පරිච්ඡේදයෙන් විට්ගන්ස්ටෛනියානු දර්ශනය පිළිබඳව පරීක්ෂා කිරීම ඇරඹේ.ඔහුගේ දාර්ශනික අවධීන් දෙක අතුරෙන් පූර්වගාමී අවධිය කෙරෙහි මෙහිදී අවධානය යොමුවී ඇත.අප අධ්‍යයනයේ මූලික තේමාව අපරගාමී අවධිය වටා ගොඩනැගෙන්නක් වුවද, ප්‍රාග්-චින්තාවෙන් බැහැරව එය තේරුම් ගැනීම පවා උගහටය. ඇත-විට්ගන්ස්ටෛන් භාෂාව කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමත්

මැත-දර්ශනය මුලුමනින්ම පාහේ මුල් අදහස් වලට එල්ල කරන ලද ප්‍රහාරයක ස්වරූපය ගැනීමත් නිසා ඇත-දාර්ශනික චින්තා කෙරෙහි අපගේ අවධානය මුලින් යොමු කෙරුණු බව සඳහන් කරනු කැමැත්තෙමි. මෙය අපගේ උක්ත අධ්‍යයනය මැනවින් තේරුම් ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නේය යනු මගේ හැඟීම විය.

මේ අධ්‍යයනයේ මූලික තේමාව රැගත් සිව්වන පරිච්ඡේදය නව මුහුණුවරක් ගන්නකි. මෙහිදී මුලු මැත කාලීන දර්ශනයම ඒවායේ වැදගත්කම අනුව මූලික කොටස්වලට වෙන්කැරුණු අතර ඒ ඒ අංශ පිළිබඳව වෙන් වශයෙන් සළකා බැලීමට උත්සාහ කෙරී ඇත. සමකාලීන වෙනත් දාර්ශනික චින්තා සමග කෙරුණු තුලනාත්මක විග්‍රහයන්ද මෙහිදී නොඅඩුව ඇත.

මෙහි පස්වන පරිච්ඡේදය අමුතුම රටාවක් ගන්නකි. බටහිර ශ්‍රේෂ්ඨ චින්තකයෙකු වශයෙන් සැළකෙන කාන්ට්ගේ දර්ශනය සමග විට්ගන්ස්ටෙයිනියානු චින්තනය තුලනාත්මකව සළකාබැලීමක් මෙහිදී කෙරී ඇත. මෙවැන්නකට විශේෂයෙන් හේතුවූයේ, කාන්ට් සහ විට්ගන්ස්ටෙයින් යන දාර්ශනිකයින් දෙදෙනාම ඉදිරිපත් කළ අදහස් අතර කිට්ටු සමානතාවයන් දක්නට ලැබීමයි. එනම් කාන්ට් ගේ බුද්ධියේ සීමාවන් සහ විට්ගන්ස්ටෙයින් ගේ භාෂාවේ සීමාවන් ද එකම කාසියේ දෙපැත්තක් මෙන් අප දැක ඇත යන්නයි.

විට්ගන්ස්ටෙයිනියානු දර්ශනය පිළිබඳව කෙරෙන සමාලෝචනය අවසන් පරිච්ඡේදය තුළින් ඉදිරිපත් කෙරේ. මෙහිදී එම චින්තාව පැහැදිළිව තේරුම් ගැනීමේදී මතුවන දුෂ්කරතාවයන් විශේෂයෙන් සළකා බැලී ඇත. අවසන් වශයෙන් එම දුෂ්කරතාවයන් ජයගැනීමේ හැකියාවන් පිළිබඳව අවධාරණය කෙරිණි.